ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
Uva Provincial Department of Education

පෙරහුරු පරීක්ෂණය - 2025

11 ශ්‍රේණිය	භූගෝල විද්‍යාව - I, II	කාලය : පැය 03 යි

අමතර කියවීම කාලය විනාඩි 10 යි

සැළකිය යුතුයි

- **මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න 40කින් සමන්විතය.**
- **එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති උපදෙස්වලට අනුකූලව සියලුම ප්‍රශ්නවලට මෙම ප්‍රශ්න පත්‍රයේම පිළිතුරු සපයන්න.**

- **අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවල එක් එක් හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන් තුලින තෝරා හිස් ඉරමත ලියන්න.**

01. සංයුතිය අනුව පෘථිවි පද්ධතියේ උප පද්ධති ගණන ..... කි.

(දෙක / තුන / හතර)

02. පෘථිවියේ ඇති සම්පත් අතරින් ..... ජෛව සම්පත් ගණයට අයත්වේ.

(පස / ජලය / වනාන්තර)

03. පෘථිවි අභ්‍යන්තරයේ මැග්මා සිසිල් වීමෙන් සෑදෙන පාෂාණය ..... පාෂාණ නමින් හැඳින්වේ.

(නිශ්ක්‍රාන්ත ආග්නේය / ආක්‍රාන්ත ආග්නේය / අවසාධිත)

04. ඇමර්සන්, කොන්ගෝ වැනි විශාල වනාන්තර ව්‍යාප්තව ඇත්තේ ..... දේශගුණික කලාපයේය.

(සෞම්‍ය / නිවර්තන / ශීත)

05. වර්තමානය වනවිට ලෝක ජන සංඛ්‍යාව දෙගුණ වීමට ගතවන කාලය අවුරුදු ..... කි.

(12 / 15 / 20)

- **අංක 06 සිට 10 තෙක් දී ඇති එක් එක් ප්‍රකාශ නිවැරදි නම් " නි " යන්න වටාද වැරදි නම් "වැ" යන්න වටාද රවුමක් අඳින්න.**

06. මෙසෝ ගෝලය තුළ වායුව තුනීවන අතර එහි විද්‍යුත් ක්‍රියා බහුලව පවතී. නි / වැ

07. පෘථිවි පෘෂ්ටයට අයත් සාගර ප්‍රදේශ සැකසී ඇත්තේ සිලිකා හා ඇලුමීනියම් වලිනි. නි / වැ

08. මෝටර් රථ කර්මාන්තයේ නිෂ්පාදන අයිතිය බොහෝවිට බහුජාතික සමාගම් සතුවේ. නි / වැ

09. පුනර්ජනනීය බලශක්ති භාවිතයෙන් පරිසර දූෂණය අවමවේ. නි / වැ

10. ලෝකයේ දේශගුණික කලාප අතරින් සෘතු භේදය පැහැදිලිව දැකිය හැකි වන්නේ නිවර්තන කලාපයේය. නි /වැ

22.

" අ "	" ආ "
රට	යකඩ හා වානේ නිෂ්පාදන මධ්‍යස්ථානය
1. චීනය	A - කුස්නෙට්ස් ප්‍රදේශය
2. එක්සත් රාධානිය	B - මැන්චුරියා ප්‍රදේශය
3. රුසියාව	C - බර්මින්හැම් ප්‍රදේශය
	D - ග්ලාස්ගෝ ප්‍රදේශය

1. A, D, B 2. B, C, D 3. D, A, C 4. B, C, A (.....)

23.

" අ "	" ආ "
පෘතුවි ව්‍යුහයේ ස්ථර	පාෂාණමය සංයුතිය
1. මහාද්වීප කබොල	A - සිලිකා හා මැග්නිසියම්
2. සාගරික කබොල	B - සිලිකා හා ඇලුමිනියම්
3. ඉහල ප්‍රාවරණය	C - ඔලිවින් හා සිලිකේට්
	D - නිකල් හා යකඩ

1. C, A, D 2. C, A, B 3. B, A, C 4. B, A, D (.....)

24.

" අ "	" ආ "
භූ තැටිය	අයත් රට
1. අප්‍රිකානු තැටිය	A - අයිස්ලන්තය
2. ඉන්දු ඔස්ට්‍රලියානු තැටිය	B - ග්‍රීන්ලන්තය
3. යුරේෂියානු තැටිය	C - මැඩගස්කරය
	D - නවසීලන්තය

1. C, D, A 2. C, D, B . C, D, A 4. B, C, D (.....)

- **අංක 25 සිට 40 තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට දී ඇති වරණ අතරින් නිවරදි හෝ වඩාත් ගැලපෙන හෝ පිළිතුර තෝරා ඊට හිමි අංකය ඉදිරියේ ඇති තිත් ඉරමත ලියා දක්වන්න.**

25. ශ්‍රී ලංකාවේ මයෝසින හුණුගල් නිධි දක්නට ලැබෙන දිස්ත්‍රික්කය ලෙස සැලකෙන්නේ,

1. පුත්තලම 2. ත්‍රිකුණාමලය 3. මහනුවර 4. හම්බන්තොට (.....)

26. ශ්‍රී ලංකාවේ වගාවට යොදාගෙන ඇති බිම් ප්‍රමාණය අනුව වැඩිම අගයක් ගන්නා භෝගය වන්නේ,

1. තේ 2. පොල් 3. රබර් 4. වී (.....)

27. බස්නාහිර පළාතේ පිහිටා ඇති වී පර්යේෂණායතනය මින් කුමක්ද?

1. ගන්නොරුව 2. බතලගොඩ 3. මහඉලුක්පල්ලම 4. බෝඵවල (.....)

28. ආපදා කළමනාකරණයට චක්‍රයට අනුව ප්‍රතිචාර දැක්වීමේ අවස්ථාවේ ගතයුතු ක්‍රියාමාර්ගයක් වන්නේ,

1. ආපාදා පූර්ව ලක්ෂණ හඳුනා ගැනීම. 2. ආපදාවට සුදානම් වීම
4. වෙද්‍ය ප්‍රතිකාර ලබා දීම. 4. ප්‍රජාව දැනුවත් කිරීම. (.....)

29. ලොව අඩුම ජන සංඛ්‍යාවක් වාසය කරන මහාද්වීපය වන්නේ,

1. අප්‍රිකා මහාද්වීපය 2. උතුරු ඇමරිකා මහාද්වීපය
4. යුරෝපා මහාද්වීපය 4. ඕස්ට්‍රේලියා මහාද්වීපය (.....)

- අංක 11 සිට 16 තෙක් ප්‍රශ්නවලට හිස්තැනට සුදුසු වචන යොදා සම්පූර්ණ කරන්න.

11. ශ්‍රී ලංකාවේ සමස්ත ජලවහනය ..... රටාවකින් යුක්තය.

12. ශ්‍රී ලංකාවේ මුල්ම ජන සංගණනය පවත්වා ඇත්තේ ..... වර්ෂයේය.


13. මයික්‍රෝ වාහන එකලස් කිරීමේ කර්මාන්ත ශාලාව ..... ප්‍රදේශයේ පිහිටා ඇත.

14. රන්න, මින්දෙනිය ..... යන ප්‍රදේශ සුළු පොල් ත්‍රිකෝණයට අයත්වේ.

15. 1: 50000 සිතියම්වල සමෝච්ච රේඛා අන්තරය මීටර් ..... කි.

16. වර්ෂණයෙන් ලැබෙන ජලය පොළොව තුලට කාන්දු වී අපාරගම්‍ය පාංශු ස්ථර මත තැන්පත් වීමෙන් ..... ජලය නිර්මාණයවේ.

- අංක 17 සිට 19 තෙක් ප්‍රශ්ණවලට පිළිතුරු සැපයීම සඳහා පහත ප්‍රස්ථාර සටහන උපයෝගී කර ගන්න.



17. ඉහත ප්‍රස්ථාරයට අනුව උපරිම උෂ්ණත්වයක් තිබූ මාසය කුමක්ද? .....

18. අවම උෂ්ණත්වය පෙන්නුම් කරන මාසය කුමක්ද? .....

19. සාමාන්‍ය උෂ්ණත්වය හා අවම උෂ්ණත්වය අතර වැඩිම පරතරයක් තිබූ මාසය කුමක්ද? .....

- **අංක 20 සිට 24 තෙක් දී ඇති ප්‍රශ්නවල "අ" හා " ආ" යනුවෙන් තීරු දෙකක් දැක්වේ. "අ" තීරුවේ ඇති තොරතුරු සමඟ ගැලපුවිට නිවැරදි අනුපිළිවෙළ දැක්වෙන අංකය, ඉදිරියේ ඇති තිත් ඉරමත ලියා දක්වන්න.**

20.

" අ "	" ආ "
සාගර	අයත්වන මුහුද
1. අත්ලාන්තික් සාගරය	A - කහ මුහුද
2. ඉන්දියන් සාගරය	B - කැරිබියන් මුහුද
3. පැසිපික් සාගරය	C - අන්දමන් මුහුද
	D - සුදු මුහුද

1. B, C, A 2. B, C, D 3. C, D, A 4. D, B, C (.....)

21.

" අ "	" ආ "
අපනයන ද්‍රව්‍ය	අපනයන ගම්මානය
1. වී	A - දඹදෙනිය
2. කජු	B - රාජාංගනය
3. මිරිස්	C - කටුගම්පොල
	D - කුරුණෑගල

1. D, A, B 2. A, B, D 3. B, D, A 4. C, B, A (.....)

30. මහරත්මල්, අරළු, බුළු, නෙල්ලි ආදී ශාඛ බහුලව දැකිය හැක්කේ,

1. කඳුකර වියළි කලාපිය වනාන්තරවල 2. කටුපඳුරු හා ලඳු කැලෑවල
4. කඳුකර තෙත් කලාපිය වනාන්තරවල 4. අතරමැදි සදාහරිත වනාන්තරවල (.....)

31. ශ්‍රී ලංකාවේ වැඩිම වර්ෂාපතනයක් ලැබෙන මාලිබොඩ පිහිටා ඇත්තේ කුමන දිස්ත්‍රික්කයේද?

1. මාතලේ 2. කෑගල්ලේ 3. නුවරඑළිය 4. බදුල්ල (.....)

32. ජීවීන්ට අහිතකර සූර්ය විකිරණ අවශෝෂණය කරනු ලබන ඕසෝන් ස්ථරයන් පිහිටා ඇති වායු ස්ථරය වනුයේ,

1. පරිවර්තිගෝලය 2. අපරිවර්තිගෝලය 3. මෙසෝගෝලය 4. තාපගෝලය (.....)

33. රටක සංවර්ධනය මැනීම සඳහා යොදාගන්නා නූතන මිනුම කුමක්ද?

1. මානුෂ සංවර්ධන දර්ශකය 2. ප්‍රතිශිර්ෂ දළ ජාතික නිෂ්පාදනය
4. ජීවන තත්ත්ව දර්ශකය 4. ළදරු මරණ අනුපාතිකය (.....)

34. ශ්‍රී ලංකාවේ ආර්ථිකයට වැඩිම දායකත්වයක් ලබා දෙන කර්මාන්තය කුමක්ද?

1. ආහාර හා පානවර්ග 2. රසායන ද්‍රව්‍ය
4. රෙදිපිළි හා ඇඟලුම් 4. රබර් නිෂ්පාදන (.....)

35. පෘථිවි ආදර්ශ ගෝලයේ උතුරු අක්ෂාංශ 23 ½ රේඛාව හඳුන්වනු ලබන නම කුමක්ද?

1. කර්කටක නිවර්තනය 2. සමකය
4. මකර නිවර්තනය 4. ආක්ටික් වෘත්තය (.....)

36. අන්තර් ජාතික සාගර නීතියට අනුව රාශ්ට්‍රිය මුහුදු සීමාව ලෙස සලකන්නේ,

1. වෙරළේ සිට නාවික සැතපුම් 200 දක්වා මුහුදු සීමාව
2. වෙරළේ සිට නාවික සැතපුම් 12 දක්වා මුහුදු සීමාව
3. නාවික සැතපුම් 24 සිට 200 දක්වා මුහුදු සීමාව
4. නාවික සැතපුම් 12 ත් 24 දක්වා මුහුදු සීමාව (.....)

- **A, B, C, ඩ වලින් දක්වා ඇති එකිනෙකට සම්බන්ධ මාතෘකා යුගල හොඳින් අධ්‍යනය කර අංක 37 – 40 තෙක් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A – 1. අවිධිමත් මානුෂ ක්‍රියා
2 . ගෝලීය උෂ්ණත්වය වැඩිවීම

B - 1. නායයෑම්
2 . පාංශු බාදනය

C – 1. පුම්නිරි අනුපාතය
2. වියපත් වීම

D - 1. පරිසර දූෂණය
2. පුනර්ජනනීය බලශක්ති භාවිතය

37. පළමුවැන්නේ අහිතකර ක්‍රියා නිසා දෙවැන්න සිදුවිය හැකි බව දැක්වෙන මාතෘකා යුගලය කුමක්ද?

1. A 2. B 3. C 4. D (.....)

38. පළමුවැන්න සිදුවීමට දෙවැන්න හේතුවන බව දක්විය හැකි මාතෘකා යුගලය කුමක්ද?

1. A 2. B 3. C 4. D (.....)

39. පළමු වැන්නේ අහිතකර තත්ත්වයන් අවම කර ගැනීමට දෙවැන්න හේතුවිය හැකි බව දැක්වෙන මාතෘකා යුගලය කුමක්ද?

1. A 2. B 3. C 4. D (.....)

40. පළමුවැන්න හා දෙවැන්න අතර සම්බන්ධතාවයක් නොමැති මාතෘකා යුගලය කුමක්ද?

1. A 2. B 3. C 4. D (.....)

II පත්‍රය

- **මෙම ප්‍රශ්ණ පත්‍රය 1 හා 11 වශයෙන් කොටස් දෙකකින් සමන්විතය.**
- **1 කොටසේ 01 ප්‍රශ්නය අනිවාර්යවේ. එහි (අ), (ආ) සහ (ඉ) කොටස් තුනටම පිළිතුරු සැපයිය යුතුය.**
- **11 කොටසේ ප්‍රශ්න හතරකට පිළිතුරු සැපයිය යුතුය.**
- **පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.**

1 කොටස

01. (අ) **ඔබ වෙත සපයා ඇති ශ්‍රී ලංකා 1:500000 භූ ලක්ෂණ සිතියම අධ්‍යනය කර ඒ ඇසුරින් අසා ඇති පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

- **අංක 1 සිට 1v තෙක් ඇති ප්‍රශ්නවලට ගැළපෙන පිළිතුර වරහන් තුලින තෝරා ලියන්න.**

I. මෙම සිතියම් කොටසෙහි දැක්වෙන ප්‍රදේශය අයත්වන්නේ පහත සඳහන් කවර දිස්ත්‍රික්කයටද?
(යාපනය/ මොණරාගල/ අනුරාධපුරය) (ලකුණු 01 යි)

II. A අක්ෂරයෙන් දැක්වෙන කොටුකල ප්‍රදේශයෙහි දැකිය හැකි ස්වභාවික වෘක්ෂලතා වර්ගය කුමක්ද?
(තෘණභූමි/ කඩොලාන/ වනාන්තර) (ලකුණු 01 යි)

III. B අක්ෂරයෙන් දැක්වෙන ජනාවසයෙහි පිහිටි ගොඩනැගිලි අතරින් පොදු ස්ථානයක් නොවන්නේ මින් කවිවිරෙක්ද?
(පන්සල/ ගොඩනැගිල්ල/ උප තැපැල් කාර්යාලය) (ලකුණු 01)

IV. C අක්ෂරයෙන් දක්වා ඇත්තේ කවර ලක්ෂණයක්ද?
(තැන් උස/ ත්‍රිකෝණමිතික ස්ථානය/ වැව් බැම්ම) (ලකුණු 01 යි)

V. D – E රේඛාවෙන් දක්වා ඇත්තේ කවර පාරිපාලන මායිමක්ද?
(ග්‍රාමසේවා නිලධාරී කොට්ඨාශය/ උප දිශාපති කොට්ඨාශය/ දිස්ත්‍රික්කය)(ලකුණු 01 යි)

VI. සිතියම් ප්‍රදේශයට අයත් මහා මාර්ගයේ දිග කිලෝමීටර් වලින දක්වන්න. (ලකුණු 01 යි)

VII. සිතියම්ගත ප්‍රදේශයේ නැගෙනහිර අර්ධය අඩු සංවර්ධනයක් ඇතිවීම කෙරෙහි බලපා ඇති හේතු එක්ක සඳහන් කරන්න. (ලකුණු 01 යි)

- **සිතියම් ප්‍රදේශය පිළිබඳ ප්‍රකාශ දෙකක් (V111), (1X), (X) ප්‍රශ්නවලින් දැක්වේ. ඒ එක් එක් ප්‍රකාශ කියවා ඒවා නිවැරදි නම් " නි" යන්නද වැරදි නම් "වැ" යන්නද පිළිතුරු පත්‍රයේ ඒ ඒ ප්‍රශ්නය ඉදිරියෙන් ලියා දක්වන්න.**

VIII. මෙම ප්‍රදේශයේ ජනතාවගේ ප්‍රධාන ආර්ථික කටයුත්ත වී වගාවයි. (ලකුණු 01 යි)

IX. සිතියම්ගත ප්‍රදේශයේ බෑවුම විහිදී ඇත්තේ උතුරු දිශාවටය. (ලකුණු 01 යි)

X. මෙම ප්‍රදේශයේ සම්පත් ඇසුරුකරගෙන පිහිටුවීමට සුදුසු කර්මාන්තයක් නම් කරන්න. (ලකුණු 01 යි)

(අ) ඔබ වෙත සපයා ඇති ලෝක සිතියම භොදින් අධ්‍යනය කර පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

- **අංක (1) සිට (V) තෙක් එක්එක් ප්‍රශ්නයට ඉදිරියෙන් ඉංග්‍රීසි අක්ෂර තුනක් දක්වා ඇත. නිවරදි පිළිතුර දක්වෙන අක්ෂරය සිතියමෙන් තෝරා යාබදව ඇති කොටුව තුල ලියා දක්වන්න.**

I. මිසිසිපි ගංගාව A, B, C
II. භූ චලනයන් හේතුවෙන් ජීවිත විශාල ප්‍රමාණයක් අයත්වූ රටක්වන මියන්මාරය D, E, F
III. හොමස් සමුද්‍ර සන්ධිය G, H, I
IV. 2025 වර්ෂයේදී සක්‍රිය වූ එඩ්නා ගිනිකන්ද J, K, L
V. මැන්චුරියන් තැනිතලාව M, N, O


(ඉ) ඔබ වෙත සපයා ඇති ශ්‍රී ලංකා සිතියම භොදින් අධ්‍යනය කර පහත ප්‍රශ්ණවලට පිළිතුරු සපයන්න.

- **අංක (1) සිට (V) තෙක් එක් එක් ප්‍රශ්නයට ඉදිරියෙන් ඉංග්‍රීසි අක්ෂර තුනක් දක්වා ඇත. නිවරදි පිළිතුර දක්වෙන අක්ෂරය සිතියමෙන් තෝරා යාබදව ඇතිනියමිත කොටුව තුල ලියා දක්වන්න.**

I. නුවරඑළිය දිස්ත්‍රික්කය Q, R, S
II. මාදුරුඔය ජලාශය P, T, U
III. සාම්පුර් විදුලිබලාගාරය W, X, Y
IV. සිගිරිය J, K, L
V. නිලාවෙලි ඉල්මන්ඩිට නිධිය M, N, O

11 කොටස

02. යාබදව දැක්වෙන්නේ ජල චක්‍රයේ රූප සටහනකි.



1. රූප සටහනට අනුව 1 හා 2 දැක්වෙන ස්ථානවලට යෙදිය යුතු වචන මොනවද? (ලකුණු 02 යි)

11. පෘථිවියේ ජලය පවත්නා විවිධ අවස්ථා තුනක් ලියන්න. (ලකුණු 03 යි)

111. a. වටිනා සම්පතක්වන ජලය තිරසරව පවත්වා ගත හැකි ආකාර දෙකක් ලියන්න.

b. ජලය හා වායුගෝලය අතර පවතින අන්තර්ක්‍රියාකාරිත්වය නිදසුන් දෙකක් ඇසුරින් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

03. 1. සාම්ප්‍රදායික සුළු අපනයන භෝග දෙකක් නම් කරන්න. (ලකුණු 02 යි)

11. ශ්‍රී ලංකා රජය විසින් සුළු අපනයන භෝග කෙරෙහි විශේෂ සැලකිල්ලක් දැක්වීමට හේතු වූ කරුණු තුනක් ලියන්න. (ලකුණු 03 යි)

111. a. සත්ත්ව පාලනය වැඩි දියුණු කිරීම තුලින් ශ්‍රී ලංකාවට ලබා ගත හැකි ආර්ථික වාසි දෙකක් සඳහන් කරන්න.

b. ශ්‍රී ලංකාවේ කිරි නිෂ්පාදනය වැඩි දියුණු කිරීම සඳහා රජය ගෙන ඇති ක්‍රියාමාර්ග දෙකක් ලියා කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05 යි)


04. 1. මෝටර් රථ කර්මාන්තය සඳහා ප්‍රමුඛ ස්ථානයක් ගන්නා ආසියනු කලාපයට අයත් රටවල් දෙකක් ලියන්න.
. (ලකුණු 02 යි)

11. මෝටර් රථ කර්මාන්තයේ දැකිය හැකි ප්‍රවණතා තුනක් ලියන්න. (ලකුණු 03 යි)

111. a. මෝටර් රථ නිෂ්පාදනයේදී වෙළඳපල ජයගැනීම සඳහා ලෝකයේ රටවල් අනුගමනය කරන උපක්‍රම දෙකක් ලියන්න.

b. ලෝකයේ නිෂ්පාදිත කර්මාන්ත ආශ්‍රිතව පැන නැගී ඇති සමාජ ආර්ථික ගැටලු දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

05. 1. ශ්‍රී ලංකාවේ ඛණිජ සම්පත් වර්ග කල හැකි ආකාරය යාබද රූප සටහනේ දැක්වේ. එහි A හා B වලින් දැක්වෙන ප්‍රධාන ප්‍රභේද දෙක දක්වන්න. (ලකුණු 02 යි)



11. a. ඉහත ඔබ සඳහන් කරන ලද ඛනිජ සම්පත්වලට උදාහරණ එක බැගින් ලියන්න.

b. ඛනිජ සම්පත් කැනීම සඳහා අවසර ලබා ගත යුතු ආයතනය කුමක්ද? (ලකුණු 03 යි)

111. ඛනිජ සම්පත් භාවිතයේදී මුහුණපාන ගැටළු තුනක් සඳහන් කර ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05 යි)

06. 1. ලෝකයේ ජනාධික කලාප හෙවත් ප්‍රධාන ජන සංකේන්ද්‍රණ දෙකක් ලියන්න. (ලකුණු 02 යි)

11. ආසියා මහාද්වීපයේ ඇති මිලියන නගර තුනක් නම් කරන්න. (ලකුණු 03 යි)

111. a. ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යා ව්‍යුහයේ දැකිය හැකි විශේෂ ලක්ෂණ දෙකක් ලියන්න.

b. අධික ජන සංඛ්‍යා වර්ධනයත් සමග ගෝලීය වශයෙන් පැන නැගී ඇති ගැටළු තුනක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05 යි)

07. 1. ලෝකය ස්වභාවික උපද්‍රව ඇතිවීමට බලපාන,

a. භූ විද්‍යාත්මක උපද්‍රවයක් ද?

b. දේශගුණ විද්‍යාත්මක උපද්‍රවයක්ද සඳහන් කරන්න. (ලකුණු 02 යි)

11. ලෝකයේ භූමිකම්පා ඇතිවන ප්‍රධාන කලාප තුනක් ලියන්න. (ලකුණු 03 යි)


111. a. භූමිකම්පාවක් නිසා භෞතික පරිසරයට සිදුවන බලපෑම් දෙකක් ලියන්න.

b. ස්වභාවික ආපදා තත්ත්වයට ලක්වූ ජනතාවගේ කායික හා මානසික තත්ත්වය නගා සිටුවීමට ඔබට කල හැකි යෝජනා දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05 යි)

08. 1. සංවර්ධනය මැනීම සඳහා යුදාගන්නා ලද මුල් කාලීන මිනුමක ද වර්තමාන මිනුමක්ද පිළිවෙලින් නම් කරන්න. (ලකුණු 02 යි)


11. නිරසාර සංවර්ධනයේ දී අපේක්ෂා කරන කරුණු තුනක් ලියන්න. (ලකුණු 03 යි)

111. රටක පැවැත්ම සඳහා නිරසාර සංවර්ධන ක්‍රියාදාමයක අවශ්‍යතාව නිදසුන් දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)


A
B
C
D
E
Nikhwewa
Eru Wewa
Todamaduwa
Morakulama
Ethungama
Tirappane
Divisional Secretariat
Tirappane Bazzar
Kanumullegama
THIRAPPANE
HUNUPALATHA SOUTH
Miwellewa
Galkiriyagama
Turuwila Junction
Ulagalla
Karaduwa
Dikwewa
Wannamaduwa
Wannamaduwa Wewa
Pitarlakondaragama
Manakkulama
Obadayagama
Kaltamurichchana Junction
Wagayakulama
Kaltamurichchana
Pahala Sandahankulama
Kohagallegama
Karambegama
Thirankulama
Peiniscambewa
Pudukkulama
Kuraliyawa
Bulankulama
Tee
Wanamal Diyane
Abitana
Alithana Wewa
Divulwewa
Aluth Punchikulama
Titiyagama
Kanumullegama Wewa
Tirappane Wewa
Turuwila Junction
Tirappane
Ethungama Junction
Galkiriyagama
Kaltamurichchana Wewa
Pitarlakondaragama
Manakkulama
Wagayakulama
Kaltamurichchana
Fimbirikadawala
Pahala Sandahankulama
Kohagallegama
Karambegama
Thirankulama
Peiniscambewa
Pudukkulama
Kuraliyawa
Bulankulama
Wanamal Diyane


1: 50 000

(ii) /(ஆ) /(b)



(i) ☐
(ii) ☐
(iii) ☐
(iv) ☐
(v) ☐
☐/5

(iii) /(இ) /(c)



(i) ☐
(ii) ☐
(iii) ☐
(iv) ☐
(v) ☐
☐/5

1. (i) (அ) (a) ☐/10 (ii) (ஆ) (b) ☐/5 (iii) (இ) (c) ☐/5 ☐/20

ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

අ.පො.ස(සා/පෙළ) – 2025/26 - සාධන පරීක්ෂණය

11 ශ්‍රේණිය - භූගෝල විද්‍යාව - පිළිතුරු පත්‍රය

---

1 කොටස

01. හතර
02. වනාන්තර
03. ආක්‍රාන්ත ආග්නේය
04. නිවර්තන
05. 12
06. නි
07. වැ
08. නි
09. නි
10. වැ
11. අරිය
12. 1871
13. පොල්ගහවෙල
14. තංගල්ල
15. 20
16. භූගත ජලය
17. අප්‍රේල්
18. දෙසැම්බර්
19. මාර්තු
20. 1 (C, D, A)
21. 1 (B, C, A)
22. 4 (D, A, B)
23. 3 (B, A, C)
24. 1 (C, D, A)
25. 1
26. 4
27. 4
28. 2
29. 4
30. 1
31. 2
32. 2
33. 1
34. 3
35. 1
36. 2
37. 1 (A)
38. 2 (B)
39. 4 (D)
40. 3 (C)

11 කොටස

1. (අ) 1. අනුරාධපුර
11. තණබිම්
111. ගොඩනැගිල්ල
1V. ත්‍රිකෝණමිතික උස
V. උපදිසාපති කොට්ඨාශය
V1. කි.මී. 9/ 9.5
V11. වනාන්තර හා ළඳු කළෑ පැවතීම / ගංවතුර වැනි ස්වභාවික තත්ත්වයන් පැවතීම
V111. නි 1x. නි
X. සහල් හා සහල් ආශ්‍රිත නිෂ්පාදන / මිරිදිය ධීවර කර්මාන්තය

(ආ)
1. A
11. D
111. G
1V. J
V. N

(ඉ)
1. R
11. P
111. W
1V. J
V. M